# ආඩම්බර මොනර පැටවා



ඔනේත්‍රා නානායක්කාර

කෘතියේ නම - ආඩම්බර මොනර පැංචා

ප්‍රථම මුද්‍රණය - 2023.12.03

කතාව සහ චිත්‍ර - ඔනේත්‍රා නානායක්කාර

කතෘගේ ලිපිනය - නො 102/50,
හේවාහැට පාර
තල්වත්ත.


පාසල - මහාමායා බාලිකා විදුහල

ශ්‍රේණිය - 1 ශ්‍රේණිය A

ISBN - 978-624-208-039-0

# පිදුම

ජීවිතේ ජය ගන්න අත්වැල වෙන
මගේ ගුරුදෙගුරුන්
හට..........



## ස්තූතියි

මෙම පොත ලිව්මට උපදෙස් ලබා දුන්

සෙනවිරත්න ගුරුපියාණන්ටත්,

මාගේ 1 - Aපන්තිභාර දමයන්ති  ගුරුමෑණියන්ටත්

මාගේ ආදරණිය දෙමාපියන්ටත්

මාගේ හදපිරි ස්තූතිය පුද කර සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර  
විදුහල්පතිනිය  
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර  
2023-10-20

කැළෑ ගමේ ජීවත් වුණ ලස්සනම කෙනා තමයි මොනර පැංචා. එයාට ගමේ හැමෝම ආදරේට කථා කලේ පැංචා කියලා. හැබැයි පැංචා හරිම ආඩම්බරයි.



කැළෑ ගමේ යාළුවෝ සෙල්ලම් කරන්න කථා කලත් පැංචා නම් සෙල්ලම් කරන්න ගියේ නෑ.



දවසක් පැංචා තනියම කැළෑවේ ඇවිදින්න ගිය අතරේ ලොකු වැලක පැටලුණා.බේරෙන්න බැලුවත් තව තවත් පැංචා වැලේ හිරවුණා.



මොනර පැංචා දැන් හොඳටම බයවෙලා උදව් ඉල්ලලා කෑ ගහන්න ගත්තා. අනේ මට කවුරුහරි උදව් කරන්නකෝ.




කෑ ගහන සද්දේ කැළෑවේ කෑම හොයන්න ගිය ලේන් යාළුවාට ඇහුණා.


.



වැලේ පැටලිලා හිටපු මොනර පැංචා දැකපු ලේන් යාළුවාට දුක හිතුණා. ඉක්මනින් පැංචා පැටලිලා හිටිය වැල් ටික හපලා හපලා දමලා පැංචාව බේරගත්තා.



පැංචාව බේරගත්තාට ලේන් යාළුවාට ස්තූති කළා.
යාළුවන්ගේ වටිනාකම පැංචාට දැනෙන්න ගත්තා.



ලේන් යාළුවයි, මොනර පැංචයි දෙන්නම කැළෑ ගමට යන්න පිටත් වුණා.



පැංචා එදා ඉඳන්ම හැමදාම යාළුවොත් එක්ක සෙල්ලම් කරමින් සතුටින් ජීවත් වුණා.



ආඩම්බර නොවී හැමෝම එක්ක හොඳින් ඉන්න ඕන කියලා පැංචා තේරුම් ගත්තා.

නිමි...





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරිම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ<br>
2023-10-20